නම : ගැරදෙහිපිටියේ වරිපනම් අංක 6/17 සහ ගැරදෙහිපිටියේ වරිපනම් අංක 6න් කොටසක් ; විස්තරය : අවුරුදු 10ක් වූ කොස් ගසක් ද, අවුරුදු 8ක් වූ දොඹ ගසක් සහ අනෝද ගසක් ද, අවුරුදු 5ක් වූ පුවක් ගස් 5ක් සහ ලාවුලු ගසක් ද, අවුරුදු 40ක් වූ පොල් ගස් 8ක් ද, සින්ක් තහඩු වලින් තැනූ වරිච්චි පැලක් ද, සින්ක් තහඩු ලෑලි පැලක් ද, පොල් අතු හෙවිල් ලපු ලෑලි පැල්පත් 2ක් සහ සින්ක් තහඩු හෙවිල් ලපු කපරාදු කරන ලද වැසිකිලියක් ද, එලවළු සහ අතරින් පතර වවනලද තණ පිටියේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම : වී. ඇම්. දසනායක මහත්මිය, 14, උද්‍යාන පාර, හැව්ලොක් වටුම, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූඩ්. 3, පර්චස්. 21.2.

**කැබැල්ල : 3**

නම : ගැරදෙහිපිටියේ වරිපනම් අංක 8 සහ ගැරදෙහිපිටිය පාරේ වරිපනම් අංක 14න් කොටසක් ; විස්තරය : අවුරුදු 60ක් වූ පොල් ගස් 9ක් ද, අවුරුදු 40ක් වූ අඹ ගස් 2ක් සහ කොස් ගස් 2ක් ද, අවුරුදු 20ක් වූ දවට ගසක් ද, අවුරුදු 15ක් වූ දිවුල් ගසක් ද, බිලිං ගසක් ද, දෙල් ගසක් ද, ගැටපිච්ච පඳුරු 60ක් ද, අවුරුදු 10ක් වූ, අවුරුදු 5ක් වූ අඹගස් 8ක්, අනෝද ගස් 5ක් ද, අඹරැල්ල ගස් 2ක් ද, පුවක් ගස් 4ක් ද, දොඩම් ගසක් ද, ලාවුලු ගසක් ද, කෝපි පඳුරු 3ක් ද, අවුරුදු 3ක් වූ පොල් පැලයක් ද, කොස් පැල 2ක් ද, අවුරුදු 2ක් වූ පුවක් පැල 2ක් ද, කතුරුමුරුංග ගස් 7ක් ද, සහ දෙහි ගස් 4ක් ද, අවුරුද්දක් වූ වෙරලු පැලයක් ද, පැපොල් ගස් 2ක් ද, කෙසෙල් පඳුරුද, උළු හෙවිල් ලපු කපරාදු කරන ලද ගෙයක් ද, තහඩු සහ මැටියෙන් තනන ලද පැලක් ද, පොල් අතු හෙවිල් ලපු මැටි පැලක් ද, උළු හෙවිල් ලපු කපරාදු කරන ලද වැසිකිළියක් ද, කපරාදු කරන ලද ළිඳක් ද, කපරාදු කරන ලද වැන්කියක් ද, වත්තේ එලවළු හා අතරින් පතර වවන ලද තණ පිට්ටනියෙහි තිබෙත් ; අයිතිකම් කියන අය. ඇෆ්. ආර්. ද සේරම් නෝනා මහත්මිය " සැන්ට් අයිව්ස් " වෝඩ් පෙදෙස, කොළඹ ; ප්‍රමාණය : අ. 2, රූඩ්. 3, පර්චස්. 08.9.

**කැබැල්ල : 4.**

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 1, ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 60ක් වූ පොල් ගස් 50ක් ද, අවුරුදු 50ක් වූ කොස් ගස් 7ක් ද, අවුරුදු 40ක් වූ අඹ ගසක් ද, අවුරුදු 15ක් වූ බක්මී ගසක් සහ ගිනිතුත් ගසක් ද, අවුරුදු 5ක් වූ, වනසපු පැලයක් සහ කොහොඹ පැලයක් ද, කෙසෙල් පඳුරුද, පොල් අතු පැලක් ද වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම් : මුදලිඳු ජේ. මදනායක, " කල්‍යාණි ", නුවර පාර, පෑලියගොඩ, සිරිසේන මදනායක, ස්ටේෂන් පාර, කැළණිය, ඩී. පී. මදනායක, 560, අලුත්මාවත පාර, කොළඹ 15, (නැසීගිය ඇම්. වයි. පෙරේරා මහත්මියගේ උරුමක්කාරයෝ) ; ප්‍රමාණය : අ. 0, රූඩ්, 3, පර්චස්. 17.1.

**කැබැල්ල : 5.**

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 5/2, ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 10ක් වූ කොස් ගස් 5ක් ද, අඹ ගස් 2ක් ද, කපු ගසක් ද, පොල් ගස් 2ක් ද, තිබෙත්. අවුරුදු 5ක් වූ පොල් පැල 11ක් ද, පුවක් ගස් 6ක් ද, පොර ගසක් ද, ලාවුලු ගසක් ද, අවුරුදු 3ක් වූ කොහොඹ ගසක් ද, අවුරුදු 2ක් වූ පැපොල් ගසක් ද, කෙසෙල් පඳුරුද, කපරාදු කරන ලද සින්ක් තහඩු වලින් තනන ලද කඩයක් ද, කපරාදු කරන ලද වැසිකිළියක් ද, කපරාදු කරන ලද ළිඳක් ද වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම් : කේ. සොලමන් අප්පුහාමි, 3/1, ගැරදෙහිපිටිය, වැල්ලම්පිටිය ; ප්‍රමාණය : අ. 0, රූඩ්. 0, පර්චස්. 34.9.

**කැබැල්ල : 6.**

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 12, ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 5ක් වූ කතුරුමුරුංගා ගස් 4ක් සහ පොල් අතු හෙවිල් ලපු මැටි පැලක් ද, එලවළු සහ අතරින් පතර වවන ලද තණ පිට්ටනියෙහි තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම් : මුදලිඳු ජේ. මදනායක, "කල්‍යාණි", නුවර පාර, පෑලියගොඩ, සිරිසේන මදනායක, ස්ටේෂන් පාර, කැළණිය, ඩී. පී. මදනායක 560, අළුත්මාවත පාර, කොළඹ 15, (නැසීගිය ඇම්. වයි. පෙරේරා මහත්මියගේ උරුමක්කාරයෝ) ; ප්‍රමාණය : අ. 1, රූඩ්. 0, පර්චස්. 26.7.

**කැබැල්ල : 7.**

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 3 සහ 3/1 ගැරදෙහිපිටිය පාර; විස්තරය : අවුරුදු 40ක් වූ පොල් ගස් 6ක් ද, අඹගස් 10ක් ද, කොස් ගස් 5ක් ද, සියඹලා ගසක් ද, දොඹ ගසක් ද, අවුරුදු 20ක් වූ බෙලිගස් 7ක් ද, අවුරුදු 15ක් වූ, ඉඹුල් ගසක් ද, වල් අඹරැල්ල ගසක් ද, කටු අනෝද ගසක් ද, අවුරුදු 10ක් වූ ජම්බෝල ගසක් ද, අනෝද ගසක් ද, බිලින් ගසක් ද, අවුරුදු 5ක් වූ අඹ ගස් 2ක් ද, බෙලි පැල 2ක් ද, දෙල් පැලයක් ද, කොහොඹ පැලයක් ද, ලාවුලු පැල 3ක් ද, පැපොල් ගස් 14ක් ද, අඹරැල්ල ගස් 2ක් ද සහ කෝපි පඳුරු 7ක් ද, අවුරුදු 3-5 කතුරු මුරුංගා ගස් 4ක් ද, කොස් පැල 10ක් ද, අවුරුදු 4ක් වූ පොල් පැල 16 ක් ද, අවුරුදු 2ක් වූ දෙහි ගස් 2ක් ද, කෙසෙල් පඳුරුද, සින්ක් තහඩු ගෙයක් ද, කපරාදු කරන ලද ළිං 2ක් ද, කපරාදු කරන ලද සින්ක් තහඩු හෙවිල් ලපු වැසිකිළියක් ද, පොල් අතු හෙවිල් ලපු මැටි මුලු තැන් ගෙයක් ද, පොල් අතු හෙවිල් ලපු මැටි පැලක් ද, වත්තේ එලවලු සහ අතරින් පතර වවන ලද තණ පිටියේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම් : කේ. සොලමන් අප්පුහාමි, 3/1, ගැරදෙහිපිටිය, වැල්ලම්පිටිය, විසින් කොන්ස්ටන්ස් අල්විස් මහත්මිය විවාහයට පෙර පෙරේරා, ස්ටේෂන් රෝඩ්, වැල්ලවත්ත, එමරල්ඩා රෝස් පෙරේරා මහත්මිය, " සර්නලී ", හයිලෙවල් පාර, නාවින්න, මර්වින් සිසිල් පෙරේරා, 163, යූනියන් පෙදෙස, කොළඹ, මුදලිඳු මදනායක, " කල්‍යාණි ", නුවර පාර, පෑලියගොඩ, සිරිසේන මදනායක, ස්ටේෂන් පාර, කැළණිය, ඩී. පී. මදනායක, 560, අළුත්මාවත පාර, කොළඹ 15, (නැසීගිය ඇම්. වයි. පෙරේරා මහත්මියගේ උරුමක්කාරයෝ) ; ප්‍රමාණය : අ. 2, රූඩ්. 3, පර්චස්. 14.6.

**කැබැල්ල : 8.**

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 10, ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 40ක් වූ කොස් ගස් 10ක් ද, පොල් ගස් 16ක් ද, අඹ ගස් 5ක් ද, අවුරුදු 20ක් වූ සියඹලා ගසක් ද, අවුරුදු 15ක් වූ බෙලි ගසක් ද, අවුරුදු 3-5ක් වූ කතුරු මුරුංගා ගස් 59ක් ද, අනෝද ගස් 6ක් ද, කෝපි පඳුරු 6ක් ද, කෙසෙල් පඳුරුද, උළු සෙවිල් ලපු කපරාදු කරන ලද ගෙයක් ද, පොල් අතු හෙවිල් ලපු මැටි පැලක් ද, කපරාදු කරන ලද ළිඳක් ද වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම් : ඇම්. බී. පීරිස් මහත්මිය ; සැලස්කි පෙදෙස, මරදාන ; ප්‍රමාණය : අ. 0, රූඩ්. 2, පර්චස්. 21.8.

**කැබැල්ල : 9.**

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 12 ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 50ක් වූ පොල් ගස් 6ක් ද, අවුරුදු 40ක් වූ අඹ ගස් 8ක් සහ කොස් ගස් 5ක් ද, අවුරුදු 20ක් වූ දෙල් ගසක් ද, අවුරුදු 15ක් වූ බෙලි ගස් 4ක් සහ ජම්බෝල ගස් 2ක් ද, අවුරුද්දක පැපොල් ගස් 2ක් ද, ගැටපිච්ච පඳුරු 60ක් ද, කෙසෙල් පඳුරුද, පොල් අතු හෙවිල් ලපු මැටි පැලක් ද වත්තේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම් : මුදලිඳු ජේ. මදනායක, "කල්‍යාණි"; නුවරපාර, පෑලියගොඩ, සිරිසේන මදනායක, ස්ටේෂන් පාර, කැළණිය සහ ඩී. පී. මදනායක, 560, අලුත්මාවත පාර, කොළඹ 15, (නැසීගිය ඇම්. වයි. පෙරේරා මහත්මියගේ උරුමක්කාරයෝ) ; ප්‍රමාණය : අ. 1, රූඩ්. 0, පර්චස්. 07.9.

**කැබැල්ල : 10.**

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 14, 16, 16ඒ සහ 16බී ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 40ක් වූ පොල් ගස් 60ක් ද, අවුරුදු 40ක් වූ කොස් ගස් 11ක් ද, අවුරුදු 15ක් වූ, දෙල් ගස් 2ක් ද, බෙලිගසක් ද, අවුරුදු 10ක් වූ සියඹලා ගස් 2ක් සහ අඹරැල්ල ගසක් ද, අවුරුදු 6ක් වූ අනෝද ගස් 5ක් ද, අවුරුදු 5ක් වූ බෙලි පැලයක් ද, කොහොඹ පැලයක් ද, අවුරුදු 2ක් වූ, ලාවුලු පැලයක් ද, සහ පැපොල් පැලයක් ද, මාස 3ක් වූ කොස් පැලයක් ද කෙසෙල් පඳුරක් ද, කපරාදු කරන ලද උලු හෙවිල් ලපු ගෙවල් 2ක් ද, පොල් අතු හෙවිල් ලපු මැටි පැලක් ද, ඇස්බෙස්ටෝස් ලෑලි වලක් ද, කපරාදු කරන ලද ළිඳක් ද, කපරාදු කරන ලද නාන කාමරයක් ද, සින්ක් තහඩු සහ කපරාදු කරන ලද වැසිකිලියක් ද, වත්තේ එලවලු සහ අතරින් පතර වවන ලද තණ පිටියේ තිබෙත් ; අයිතිකම් කියන අයගේ නම : ඇෆ්. ආර්. ද සේරම් මහත්මිය, "සැන්ට් අයිව්ස්", වෝඩ් පෙදෙස, කොළඹ ; ප්‍රමාණය : අ. 1, රූඩ්. 2, පර්චස්. 08.6.

කැබැල්ල : 11.

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 7/1, 7/12, සහ වරිපනම් අංක 7න් කොටසක් ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 60ක් වූ සියඹලා ගසක් සහ කෝන් ගසක් ද, අවුරුදු 40ක් වූ පොල් ගස් 40ක් ද, කොස් ගස් 6ක් ද, අඹ ගස් 8ක් ද, අවුරුදු 30ක් වූ බෝ ගසක් සහ තල් ගසක් ද, අවුරුදු 15ක් වූ දෙල් ගසක් සහ සියඹලා ගසක් ද, අවුරුදු 10ක් වූ අඹගස් 10ක් සහ බෙලි ගසක් ද, කොස් පැල 6ක් ද, දෙහි ගසක් ද, අනෝද ගස් 5ක් ද, අන්දර ගස් 2ක් ද, වනසපු ගසක් ද, අවුරුදු 3-5ක් වූ ගැටපිච්ච පඳුරු 175ක් ද, අවුරුදු 1-2ක් වූ කොහොඹ පැලයක් ද, පැපොල් පැලයක් ද, කෙසෙල් පඳුරු ද, උළුහෙවිල්ලපු කපරාදු කරන ලද ලෑලි අල්ලපු ගෙයක් ද, සින්ක් තහඩු ගැසූ කපරාදු කරන ලද ගෙයක් ද, සින්ක් තහඩු ගැසූ මැටි පැලක් ද, පොල් අතු හෙවිල්ලපු ලෑලි පැල් 2ක් ද, සින්ක් තහඩු මඩුවක් ද, කපරාදු කරන ලද වැසිකිළි 2ක් ද, කපරාදු කරන ලද ලිං දෙකක් ද, සින්ක් තහඩු මැටි වැසිකිලියක් ද, සහ කරත්ත පාරක කොටසක් ද ; අයිතිකම් කියන අයගේ නම : එච්. ඞී. ප්‍රනාන්දු මහතා, "නූරානි විලා", කොල්ලුපිටිය ; ප්‍රමාණය : අ. 3, රූඩ්, 3, පර්චස්. 38.6.

කැබැල්ල : 12.

නම : ගැරදෙහිපිටිය වරිපනම් අංක 5, 5/1, 5/12, ගැරදෙහිපිටිය පාර ; විස්තරය : අවුරුදු 10ක් වූ කොස් ගසක් ද, ඉඹුල් ගසක් ද බෝ ගසක් ද, තෙලඹු ගසක් ද, කැන්ද ගසක් ද, රුක් අත්තන ගසක් ද, නුග ගස් 73ක් ද, අවුරුදු 8ක් වූ බෙලි ගස් 8ක් ද, අවුරුදු 2ක් වූ කතුරුමුරුංගා ගස් 15ක් ද, කෙසෙල් පඳුරු ද, සින්ක් තහඩු දමා කපරාදු කර තනන ලද ගෙවල් පේලියක් ද, කපරාදු කර තනන ලද වැසිකිළියක් ද, සින්ක් තහඩු දමූ කපරාදු කර, තනන ලද හරක් පට්ටි 2ක් ද, පොල් අතු හෙවිල්ලපු මැටි ගෙවල් 2ක් ද, කපරාදු කර තනන ලද ලිං දෙකක් ද, කපරාදු කර තනන ලද ටැන්කියක් ද, පොල් අතු හෙවිල්ලපු කපරාදු කර තනන ලද ගබඩා කාමරයක් ද, පොල් අතු හෙවිල්ලපු ලෑලි මඩු දෙකක් ද, පොල් අතු හෙවිල්ලපු ලෑලි හරක් මඩුවක් ද, වත්තේ අතරින් පතර වවන ලද තණ පිටියේ තිබෙන් ; අයිතිකම් කියන අයගේ නම : පී. ඩබ්ලිව්. අමරසේකර, 155, මසන්ගස් වීදිය, කොළඹ, සී. ඞී. පෝල්, ලංකා ගුවන් විදුලි කායනීලය, කොළඹ, ඊ. පෝල් මහත්මිය සහ ජේ. කේ. මේතර්, දෙදෙනාම 106/4, දුටුගැමුණු වීදිය, දෙහිවල, ඒ. මේතර් මහත්මිය, අංක 9 ඒ, වැවර්සට් පෙදෙස, කොළඹ 6, ඊ. පෝල් අන්නම්මා මේතර්, 31, සුජාතා පෙදෙස, පාමන්කඩ, දෙහිවල ; ප්‍රමාණය : අ. 1, රූඩ්. 1, පර්චස්. 01.2.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ පහත සඳහන් දිනයන්හී හා වේලාවන්හි කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි. තවද 1960ක් වූ නොවැම්බර් මස 15 වෙනි දිනට මත්තෙන් 1, 2, 3, 4, 6, 7 සහ 9 දරණ කැබලි සම්බන්ධයෙන් සහ 1960ක් වූ නොවැම්බර් මස 30 වෙනි දිනට මත්තෙන් 5, 8, 10, 11 සහ 12 දරණ කැබලි සම්බන්ධයෙන් ද ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාව යත් එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

විභාගය පවත්වන දිනයන් : 1, 2, 3, 4, 6, 7 සහ 9 දරණ කැබලි සම්බන්ධයෙන් 1960ක් වූ නොවැම්බර් මස 29 වෙනි දින පෙරවරු 10.30ට 5, 8, 10, 11 සහ 12 දරණ කැබලි සම්බන්ධයෙන් 1960ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින පෙරවරු 10. 30ට.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
කොළඹ දිස්ත්‍රික්කයේ උප දිසාපති.

1960ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ කච්චේරියේදීය.

10-572

---

යොමු අංකය : ඇම්. ඒ. ඒ.සී. 2890/53.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වන වගන්තිය යටතේ වූ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය වී තිබෙන පහත විස්තර දක්වෙන ඉඩම්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශෝධනය කරනලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, රජයට පවරා ගැනීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි :—

රජයට පවරා ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තරය :—

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නාගරික සභාව සීමාව තුළ පිහිටි කුප්පියාවත්තේ, අංක 22 දරණ කුප්පියාවත්ත කොට්ඨාශයේ අංක ඒ—4,178 දරණ ප්‍රාරම්භ සැලැස්ම.

ඉඩම් කට්ටිය : 1.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 97/7 දරණ ඉඩමේ කොටසක් ' විස්තරය : වත්තේ මල් පැල ටිකක් සහ ගලෙන් බැඳි කුලුනක් තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඞී. දයාරත්න, 97/7, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.88.

ඉඩම් කට්ටිය : 2.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 95/1, 97/5 සහ 97/7 දරණ ඉඩම්වලට යන පාරෙන් කොටසක් ; විස්තරය : පාර ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඞී. සී. ලෝරිස් නෝනා මහත්මී, 97/5, ශ්‍රී ධම්ම මාවත ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.38.

ඉඩම් කට්ටිය : 3.

ඉඩමේ නම : මවුන්ට් මේරි පාරේ තක්සේරු අංක 43 සහ 45 දරණ ඉඩම්වලින් කොටස් ; විස්තරය : (වගාකර නැති) වත්ත, උළු සෙවිලි කළ, ගලෙන් බැඳි ගොඩනැගිලි දෙකක කොටස් සහ ගලෙන් බැඳි බිත්තියක් ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ජේ. ඒ. දයානන්ද, ඇවොන්ඩේල් පාර, මරදාන ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.04.

ඉඩම් කට්ටිය : 4.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 98 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් තිබේ. ; අයිතිවාසිකම් කියන්නාගේ නම : එච්. ජේ. සෝනාරත්න, 41, මවුන්ට්මේරි පාර, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.51.

ඉඩම් කට්ටිය : 5.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 94 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : (වගාකර නැති) වත්ත ; අයිතිවාසිකම් කියන්නාගේ නම ; කේ. බේබි නෝනා නෝනාමහත්මිය, ගල්බොරැල්ල, කැළණිය ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.23.

ඉඩම් කට්ටිය : 6.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 95 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : අවුරුදු 15ක් වූ කොස් ගහක් සහ පොල් ගහක් ද, ගලෙන් බැඳි කාණුවක් ද අඩංගු වත්ත ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇම්. ඞී. ගුණවර්ධන, පිලියන්දල ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.32.

ඉඩම් කට්ටිය : 7.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 93 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ මල් පැල ටිකක් සහ පරීක්ෂණ කුහරයක් තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ටී. කන්දසාමි, නාලන්ද විද්‍යාලය බාරේ, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.94.

ඉඩම් කට්ටිය : 8.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 91 දරණ වත්ත ; විස්තරය : පරීක්ෂණ කුහරයක් අඩංගු අප්‍රසිද්ධ පාරක් ; අයිතිවාසිකම් කියන්නාගේ නම : චාලට් මැන්දිස් නෝනා මහත්මී, 85, ශ්‍රී ධම්ම මාවත, ටී. කන්දසාමි, නාලන්ද විද්‍යාලය බාරේ, කොළඹ. ඊ. ධර්මදාස, පාඨශාලා පරීක්ෂක, කෙරවලමුල්ල ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.72.

ඉඩම් කට්ටිය : 9.

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 84, දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : මල්පැල ටිකක් සහ ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් අඩංගු වත්තක් ; අයිතිවාසිකම් කියන්නාගේ නම : පී. ඇල්. ලීලාවතී නෝනාමහත්මී, ඇම්. ඞී. පී. ප්‍රනාන්දු බාරේ, 14 කැමල් ටෙරස්, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.17.

ඉඩම් කට්ටිය : 10.

ඉඩමේ නම : නාලන්ද පෙදෙස තක්සේරු අංක 1 දරණ නාලන්ද විද්‍යාලීය ඉඩම ; විස්තරය : අගුවල කොටස් ද, උළු සෙවිලි කළ ගලෙන් බැඳි ගොඩනැගිලි දෙකක ගලෙන් බැඳි ගෙවල් කානුවක් ද, පරීක්ෂණ කුහර දෙකක් ද අඩංගු (වගාකර නැති) පාසැල් වත්ත ; අයිතිවාසිකම් කියන්නාගේ නම : බෞද්ධ පරමවිඥනාර්ථ සමාගම, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 5.44.

**ඉඩම් කට්ටිය : 11.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 85 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ මල් පැල ටිකක් තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇල්. චාලට් මැන්දිස් නෝනා මහත්මයා, 85, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.81.

**ඉඩම් කට්ටිය : 12.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 73 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 20 ක්වූ පොල් ගස් 2ක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක් ද, උළු සෙවිලි කළ ගලෙන් බැඳි ගරාජයක අගු ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇස්. එච්. කේ. මොහිදීන්, 92, දෙවෙනි හරස් වීදිය, පිටකොටුව, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.26.

**ඉඩම් කට්ටිය 13.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 52, 54, 56 සහ 58 දරණ ඉඩම්වල කොටස් ; විස්තරය : වත්තේ අවුරුදු 10ක්වූ මසන් ගහක් ද, අවුරුදු 3ක්වූ උක් ගස් පඳුරක් ද, උළු සෙවිලි කළ ගලෙන් බැඳි ගොඩනැගිල්ලක තුන්තනාගමින් සෑදූ අගුද, ලෝහ තැපැල් කණු පෙට්ටියක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඊ. පියදාස නෝනාමහත්මයා, 22, බුලර්ස් පටුමග, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 5.26.

**ඉඩම් කට්ටිය : 14.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 46 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 25ක්වූ පොල් ගස් 3ක් ද, උළු සෙවිලි කළ ගලෙන් බැඳි ගොඩනැගිල්ලක කොටසක් ද, ගලෙන් බැඳි මායිම් තාප්ප දෙකක කොටස් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : වෛද්‍යාචාර්ය ඩබ්ලිව්. ඇන්. ප්‍රනාන්දු, 36, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 6.46.

**ඉඩම් කට්ටිය : 15.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 42 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 25ක් වූ පොල් ගස් 2ක් ද ගලෙන් බැඳි මායිම් තාප්ප දෙකක කොටස් ද, පරීක්ෂණ කුහරයක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : සී. ඇම්. ප්‍රනාන්දු නෝනාමහත්මයා, 42, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 8.45.

**ඉඩම් කට්ටිය : 16.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 36 සහ 38 දරණ ඉඩම්වල කොටස් ; විස්තරය : වත්තේ මල් පැල ටිකක් ද, පරීක්ෂණ කුහරයක් ද, උළු සෙවිලි කළ ගලෙන් බැඳි ගොඩනැගිල්ලක පෝටිකෝවෙන් කොටසක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පවල කොටස් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇන්. පෝලස් ප්‍රනාන්දු, 38, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 7.24.

**ඉඩම් කට්ටිය 17.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 32 සහ 34 දරණ ඉඩම්වල කොටස් ; විස්තරය : වත්තේ මල් පැල ටිකක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක් ද, ගලෙන් බැඳි මායිම් තාප්ප දෙකක කොටස් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇන්. ඩබ්ලිව්. සුරවීර, 32, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 8.2.

**ඉඩම් කට්ටිය : 18.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 30 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ මල්පැල ටිකක් ද, ගලෙන් බැඳි මායිම් තාප්ප දෙකක කොටස් ද, ගලෙන් බැඳි ගෙවල් කානුවක කොටසක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : මහා භාරකාර තැන, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 7.30.

**ඉඩම් කට්ටිය : 19.**

ඉඩමේ නම : විද්‍යාල පෙදෙසේ තක්සේරු අංක 5 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 30ක්වූ පොල් ගස් 6ක් ද, අවුරුදු 2ක්වූ බිලින් ගසක් ද, පොල් ගසක් ද, කොස් ගසක් ද, කෙසෙල් ගස් 3ක් ද, අවුරුදු 20ක්වූ අඹ ගස් 2ක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක් ද, මායිම් තාප්පයක කොටසක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඩී. ඇල්. ජයතිලක, 5, විද්‍යාල පෙදෙස, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 2.89.

**ඉඩම් කට්ටිය : 20.**

ඉඩමේ නම : විද්‍යාල පෙදෙසේ තක්සේරු අංක 1 සහ ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 28 දරණ ඉඩම් ; විස්තරය : වත්තේ අවුරුදු 2ක්වූ පොල් ගස් 2ක් ද, අවුරුදු 2ක්වූ කෙසෙල් ගස් 4ක් ද, දෙහි ගසක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : වීරකොඩි ලැයිසාහාමි, 1, විද්‍යාල පෙදෙස සහ ගරු රත්ගම සුමන ජෝති සථවිරයන් වහන්සේ, 29/10, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 3.62.

**ඉඩම් කට්ටිය : 21.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 23 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 25ක්වූ කොස් ගහක් ද, පොල් ගහක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇම්. බී. ජයවර්ධන, 23, ශ්‍රී ධම්මමාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 0.81.

**ඉඩම් කට්ටිය : 22.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 19 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ මල් පැල ටිකක් සහ ගලෙන් බැඳි මායිම් තාප්ප දෙකක කොටස් තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : යූ. ඇන්. විජේතුංග, 19, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.46.

**ඉඩම් කට්ටිය : 23.**

ඉඩමේ නම : විද්‍යාල පෙදෙසේ තක්සේරු අංක 6 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 20—30ක්වූ පොල් ගස් 8ක් ද, අවුරුදු 10ක්වූ පුවක් ගහක් ද, පොල් ගහක් ද, කොස් ගහක් ද, අවුරුදු 1—25ක්වූ අඹගස් 2ක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් ද, ගලෙන් බැඳි ගේට්ටු කුලුණු දෙකක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : එච්. ඩී. පීරිස්, 6, විද්‍යාලය පෙදෙස, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 9.41.

**ඉඩම් කට්ටිය : 24.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 14 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ මල්පැල ටිකක්, ගලෙන් බැඳි ගගන ප්‍රහාරක නිවාරණයක කොටසක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් ද, ගලෙන් බැඳි ගෙවල් කානුවක කොටසක් ද, පරීක්ෂණ කුහරයක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම: ඇෆ්. ඩී. ඇස්. ජයරත්න, 14, ශ්‍රීධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 7.38.

**ඉඩම් කට්ටිය : 25.**

ඉඩමේ නම : ශ්‍රී ධම්ම මාවතේ තක්සේරු අංක 15 සහ 17 දරණ ඉඩම්වල කොටස් ; විස්තරය : වත්තේ මල්පැල ටිකක් ද, ගලෙන් බැඳි මායිම් තාප්ප දෙකක කොටස් ද, ගලෙන් බැඳි ගෙවල් කානුවක කොටසක් ද, ගලෙන් බැඳි ගේට්ටු කුලුණුක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : වෛද්‍යාචාර්ය කේ. කනකරත්න, 15, ශ්‍රී ධම්ම මාවත, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 2.48.

**ඉඩම් කට්ටිය : 26.**

ඉඩමේ නම : කැමල් ටෙරස්හි තක්සේරු අංක 14, දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 15ක්වූ කොස් ගහක් ද, මල් පැල ටිකක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් ද, ගලෙන් බැඳි ගේට්ටු කුලුනක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇම්. ඩී. පී. ප්‍රනාන්දු, 14, කැමල් ටෙරස්, කොළඹ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.74.

**ඉඩම් කට්ටිය : 27.**

ඉඩමේ නම : කැමල් ටෙරස්හි තක්සේරු අංක 14 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 5ක්වූ කොස් ගහක් ද අවුරුදු 15ක්වූ අඹ ගහක් ද, අවුරුදු 5ක්වූ කෙසෙල් ගස් 3ක් සහ මල් පැල ටිකක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : රජය : ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 1.56.

**ඉඩම් කට්ටිය : 28.**

ඉඩමේ නම : කැමල් ටෙරස්හි තක්සේරු අංක 14 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ මල්පැල ටිකක් තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ඇම්. ඩී. පී. ප්‍රනාන්දු, 14, කැමල් ටෙරස්, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 0.61.

**ඉඩම් කට්ටිය : 29.**

ඉඩමේ නම : කිට්ටයාකාර පාරේ තක්සේරු අංක 6 දරණ ඉඩමේ කොටසක් ; විස්තරය : වත්තේ අවුරුදු 2ක්වූ කෙසෙල් ගස් 4ක් සහ පොල් ගස් 3ක් ද, අවුරුදු 30ක්වූ අඹ ගසක් ද, අවුරුදු 10ක්වූ මුරුංගා ගහක් ද, සැපදිල්ලා ගහක් ද, අවුරුදු 5ක්වූ පේර ගහක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ජේ. ඇන්. ඩයස් නෝනා මහත්මයා, 6, කිට්ටයකාර පාර, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.85.

**ඉඩම් කට්ටිය : 30.**

ඉඩමේ නම : කැමල් පෙදෙස තක්සේරු අංක 77 දරණ ඉඩමේ කොටසක් ; විස්තර : වත්තේ අවුරුදු 10—25ක්වූ පොල් ගස් 4ක් ද, අවුරුදු 40ක්වූ අඹ ගස් 2ක් ද, අවුරුදු 10ක්වූ මුරුංගා ගහක් ද, ගලෙන් බැඳි මායිම් තාප්පයක කොටසක් ද තිබේ ; අයිතිවාසිකම් කියන්නාගේ නම : ප්‍රාදේශික විධායක ගැලවීමේ හමුදාව, 61, ජෙනරල්ස් ලේක් පාර, කොළඹ ; ඉඩම් ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 04.92.

එකතුව : අ. 0, රූ. 2, ප. 21.16.

**ඉඩම් කට්ටි 1—10 : 1960 නොවැම්බර් 30 වෙනි දින අ. භා. 2ට.**

**ඉඩම් කට්ටි 11—20 : 1960 දෙසැම්බර් 1 වෙනි දින අ. භා. 2ට.**

**ඉඩම් කට්ටි 21—30 : 1960 දෙසැම්බර් 2 වෙනි දින අ. භා. 2ට.**

ඉහත සඳහන් ඉඩම් සම්බන්ධව අයිතිවාසිකම් කියා සිටින සියලු දෙනාම ඉහත සඳහන් දිනයන්හි පුද්ගලිකව හෝ තමන්ගෙන් ලියවිල්ලකින් බලය ලත් නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ කොළඹ නාගරික කාර්යාලයේදී මා ඉදිරිපිට පෙනී සිටිය යුතු බවත්, තමන්ගේ අයිතිය පිළිබඳ සම්පූර්ණ විස්තර හා ඉඩම් රජයට පැවරීමේදී තමන්ට හිමිවිය යුතු වන්දි මුදල් ප්‍රමාණයද ඒ වන්දි මුදල් පිළිබඳ සම්පූර්ණ විස්තරද (පිටපත් දෙකකින්) 1960 නොවැම්බර් 23 වෙනි දින හෝ ඊට පෙර හෝ මා වෙත දන්වා එවිය යුතු බවත්, මෙයින් දැනුම් දෙමි.

බී. ඒ. ජයසිංහ,
කොළඹ නාගරික කොමසාරිස් හා ඉඩම් පවරා ගැනීමේ නිලධාරි තැන.

1960 ඔක්තෝබර් 12 වෙනි දින,
කොළඹ, නගර ශාලාවේ නාගරික
කොමසාරිස් තැනගේ කාර්යාලයේදීය.

10-538.

---

අංකය : ඇල්. ඩී./ඇ්ජ්—34

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950ගේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950ගේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ බෙරගම ගම්මුලාදෑනි කොට්ඨාශයේ මැදසිය පත්තුවේ විගුහුම්පොල ගමෙහි පිහිටි මුල් සිතියම් අංක 2,699 හි කැබලි අංක 1 සහ 2 වශයෙන් මැන විස්තර කර ඇති දැනට විගුහුම්පොල පදිංචි ආර්. ඇම්. චන්ද්‍රවතී මැණිකේ සහ ජී. ජී. රත්නායිදේ විසින් අයිතිවාසිකම් කියනු ලබන පර්චස් 04.0ක්වූ වැලිකුඹුර නැමති ඉඩම් කොටස.

ඉහත් සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම හෝ තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1960 නොවැම්බර් 23 වැනි දින පූ. භා. 10ට මහනුවර දිසාපති කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1960 නොවැම්බර් 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මාවෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. එකී ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලු ඔප්පු සහ ලියකියවිලි ද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත.

1960 ඔක්තෝබර් 12 වැනි දින,
මහනුවර කච්චේරියේදීය.

10-465

---

සඳහන් අංකය : ජේ 58/59 ඊ. 183/ඇල්බී 2391

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950ගේ අංක 9 දරන ඉඩම් අත්කරගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

සැලැස්ම අංකය : මූලික සැලැස්ම අංක ඒ 1,795. පහත සඳහන් ඉඩම මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදායම් නිලධාරි කොටසේ, දන්දෙනිය ගම්මුලාදෑනි වසමේ, දන්දෙනියේ පිහිටා තිබේ.

**කැබලි අංක : 1.**

ඉඩමේ නම : ජුල්ගස්හේන ; ඉඩමේ විස්තර : අවුරුදු 3ක් පමණවූ පොල්පැල 51ක්ද, අවුරුදු 10ක් පමණ වයස්වූ කොස්ගස් 1ක් ද, අවුරුදු 20ක් පමණ වයස්වූ කොස්ගස් 2ක්ද, අවුරුදු 6ක් පමණ වයස්වූ කජුගස් 1ක්ද, අවුරුදු 1-3 පමණ වයස්වූ කජුපැල 3ක්ද ඇති පොල් ඉඩම ; අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් : කැගල්ලේ, රන්දෙනියේ, අමුණුගම, ආරියනන්ද සමරසිංහ සහ ඇස්. කේ. නන්දසේන සමරසිංහ ; බිම් ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 39.0.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 නොවැම්බර් මස 28 දින පෙ. ව. 10 ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960 නොවැම්බර් 20 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනීසිටීමට ලියවිල්ලකින් බලයලත් නියෝජිතයන් හෝ මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

තම තමන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියළු ඔප්පු තිරප්පු හා අනික් ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

එච්. ආර්. අමිත්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය,
1960 ඔක්තෝබර් මස 12 දාය.

10-559

---

සඳහන් අංකය : ජේ 58/59 ඇල් ජ 51—ඇල් බී 2384.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950ගේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

මහාජන කාර්යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

පහත සඳහන් ඉඩම් මාතර දිස්ත්‍රික්කයේ කන්දබඩපත්තුවේ පන්ඩිත පෝරුව ගම පිහිටා තිබේ. සිතියම් අංකය අවසාන ගම් සිතියමේ අංක 83 නේ අංක 6 දරන අතිරේකය.

**කැබලි අංක : 35.**

ඉඩමේ නම : කළුගලම්භහේන නොහොත් විජයගොඩ අප්පුහේන ; විස්තර : අවුරුදු 30කට—වැඩි වයස්වූ රබර් ගස් 13ක් ; අයිතිකරුගේ නම් සහ ලිපිනය : ඩී. ජේ. රණවීර මහතා අංක 96, මැකාර්ති පාර, කොළඹ 7 ; ප්‍රමාණය : අ. 2, රූ. 0, ප. 05.3.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවක් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් අයිතිකම් සහ ඉඩම්වල වටිනාකම්ද ඔප්පුකිරීම පිණිස ලියවිලිද රැගෙන 1960 නොවැම්බර් මස 28 දින පස්වරු 2 ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද එම අය විසින් හෝ ඔවුන්ගෙන් බලයලත් අය විසින් ඉහතකී අන්දමට ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960 ක්වූ නොවැම්බර් 20 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

එච්. ආර්. අමිත්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය,
1960 ඔක්තෝබර් මස 12 දාය.

10-558

සඳහන් අංකය: ජේ 58/59 ඇල් ජී 129—ඇල් බී 2389.

## 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950යේ අඞක 9 දරන ඉඩම් අත්කරගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954ජේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

පහත සඳහන් ඉඩම් මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ ඉඹුල්ගොඩ ගමේ පිහිටා තිබේ. සිතියම් අංකය: අවසාන ගම් සිතියම් අංක 541 කේ අංක 1 දරණ අතිරේකය.

**කැබලි අංක: 61.**

ඉඩමේ නම: ඉඹුල්ගොඩවත්ත; විස්තර: හේන; අයිතිකරුගේ නම සහ ලිපිනය: එඩ්වර්ඩ් සේනාරත්න මයා, දෙනිපිටිය, වැලිගම; ප්‍රමාණය: අ. 2, රූ. 0, ප. 0.1.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන් ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් අයිතිකම් සහ ඉඩම්වල වටිනාකම්ද ඔප්පු කිරීම පිණිස ලියවිලි රැගෙන 1960 නොවැම්බර් මස ?8 දින පස්වරු 3 ට මාතර කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද එම අය විසින් හෝ ඔවුන්ගෙන් බලයලත් අය විසින් ඉහතකී අන්දමට ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960 නොවැම්බර් 20 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි නියම කරමි.

එච්. ආර්. අමිත්,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

මාතර කච්චේරිය,
1960 ඔක්තෝබර් මස 12 දාය.

10-557

සඳහන් අංකය: 3/61/16—ජේ 55 ඇල් 563

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ සංශෝධිත ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම් ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954ජේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි ඉපවගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩම්වල විස්තර:—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වන්නි හත් පත්තුවේ හල්මෙ පළාතේ හල්මෙ නමැති ගමේ පිහිටි පහත විස්තර කර ඇති ඉඩම්:—

අංක 2,903 දරණ ග. සි. 1 වැනි උඩෘතයේ. හල්මෙ

**කට්ටි අංක 63.**

ඉඩමේ නම: මයිලගහවත්ත; විස්තර: හේන; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 11.1; අයිතිවාසිකම් කියන්නා' ආර්. ඇම්. පුන්චිරාල, හිටපු වෙල් විදානේ, හල්මෙ.

**කට්ටි අංක 63½**

ඉඩමේ නම: මයිලගහවත්ත; විස්තර: වාරිමාර්ග ඇල; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 10.1; අයිතිවාසිකම් කියන්නා: ආර්. ඇම්. පුන්චිරාල, හිටපු වෙල් විදානේ, හල්මෙ.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමවලට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1960 දෙසැම්බර් මස 20 වැනි දින උදේ 10.30ට හල්මෙ රජයේ පාසැලේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම් පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම් පවරගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1960 දෙසැම්බර් 15 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

ඇම්. ඇල්. ජේ. වික්‍රමරත්න,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උපඒජන්ත.

1960 ඔක්තෝබර් මස 12 වැනි දින,
කුරුණෑගල කච්චේරියේදීය.

10-464

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.